රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/01චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234 / A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022.10. 14

චක්‍රලේඛ අංකය : 07 /2022 (i)

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මගින්

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

<u>උප්පැන්න ලේඛනවල නම් වෙනස් කිරීම අලුතින් නම් ඇතුලත් කිරීම්.</u>

ඉහත කරුණට අදාළව 2022.06.16 දිනැතිව නිකුත් කරන ලද අංක 07/2022 දරණ චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

02. එම චක්‍රලේඛයේ 03 වන ඡේදය "වයස අවුරුදු 07 ට අඩු දරුවෙකුගේ නමක් වෙනස් කිරීමට/ අලුතින් නමක් ඇතුලත් කිරීමට ඉල්ලීම ඉදිරිපත් වන විටදී 27 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රය හා දෙමව්පිය/භාරකරුගේ ඉල්ලීම් ලිපිය පමණක් ප්‍රමාණවත් වේ."

03. එලෙසම එම චක්‍රලේඛයේ 04 වන ඡේදයෙහි සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි වල (ii) කරුණ පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(ii) දෙමව්පිය/භාරකරුගේ ඉල්ලීම් ලිපිය

03. තවද එම චක්‍රලේඛයේ 11 වන ඡේදයෙහි සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

<u>සංශෝධනය සිදු කිරීමට අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රය
ii. තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත්‍රය (ඇමුණුම 1 හෝ 2)
iii. දිනපතා හෝ සති අන්ත පුවත්පතක පළ කරන ලද පුවත්පත් දැන්වීම
iv. දිවුරුම් ප්‍රකාශය
v. ග්‍රාම නිලධාරී වාර්තාව
vi. දෙමව්පියන්ගේ විවාහ සහතිකය (තිබේ නම්)
vii. ඉල්ලුම් කරන නම භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන 03ක් ප්‍රමාණවත්)

*පුවත්පත් දැන්වීම පළකර වසරක කාලයක් ඉක්මවා තිබේ නම් නම භාවිත කළ බවට වන ලේඛන වසරකට වැඩි කාලයක් භාවිත කර තිබීම අවශ්‍ය නොවන අතර,වසරකට වඩා වැඩි කාලයක් නම

2

දුරකථන අංකය / தொலைபேசி இல. 2889488 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் rgd@sltnet.lk rg@rgd.gov.lk

භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි තිබේ නම් පුවත්පත් දැන්වීම පළ කර වසරක කාලයක් ඉක්මවීම ද අවශ්‍ය නොවේ.

04. අංක 07/2022 දරණ මුල් චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව බලපැවැත්වේ.

05. මෙම චක්‍රලේඛය 2022.10. 14 දින සිට ක්‍රියාත්මක වේ.

06. කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව මා වෙත දන්වන්න.

පී. එස්. පී. අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

1. ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
3. ජාතික බුද්ධි ප්‍රධානී , ආරක්ෂක අමාත්‍යාංශ - කාරුණික දැන ගැනීම සඳහා
4. සියළුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කාරුණික දැන ගැනීම සඳහා
5. ප්‍රධාන කාර්යාලයේ සියළුම විධායක හා මාණ්ඩලික නිලධාරීන්- කාරුණික දැන ගැනීම සඳහා